INTERNATIONAL TRUTH AND JUSTICE PROJECT

W ITJPSL.COM
E ITJPSL@GMAIL.COM

EXECUTIVE DIRECTOR:
YASMIN SOOKA

2021 ජූනි 1

# ප්‍රවෘත්ති නිවේදනය: ශ්‍රී ලංකාවේ නව පත්වීම් සංක්‍රමණික යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන්ගේ ශේෂයන් ද විසුණු කරයි.

**ජොහැන්නස්බර්ග්:** යුද සමයේ හිටපු පොලිස්පතිවරයා ශ්‍රී ලංකාවේ අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාංශයට පත්කිරීම, පසුගිය ආණ්ඩුව යටතේ ස්ථාපිත කරන ලද සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ යාන්ත්‍රණය මිලිටරීකරණය කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කරනු ලබයි. මැයි 20 වැනිදා පාර්ලිමේන්තු නියෝජිතයන් විසින් අනුමත කරන ලදුව[1], හිටපු පොලිස්පති හපු ආරච්චිගේ ජයන්ත ශාන්ත කුමාර වික්‍රමරත්න ඊට පත්කිරීමට ගන්නා ලද තීරණය විසින් අතුරුදහන්වූවන්ගේ පවුල් සඳහා සත්‍යය සහ යුක්තිය සඳහා වූ කවර හෝ අවස්ථාවක් වී නම් එය මකා දමනු ඇතැයි සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ විශේෂඥ යස්මින් සූකා කියා සිටින්නීය.

"යුද්ධාවසානයේදී සමූහ අතුරුදහන්කිරීම් සම්බන්ධයෙන් වගකිව යුතු බවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විමර්ශන මගින් නම්කරන ලද පොලිස් ඒකක තුනක් භාරව කටයුතු කළ පුද්ගලයාම දැන් අතුරුදහන්වීම් සම්බන්ධ විමර්ශන සිදුකරමින් සිටියි. මේ වනාහී විදේශගත වුවහොත්, පොලිස් වධහිංසා වැනි බරපතල මානව හිමිකම් උල්ලංඝණයන්ට අදාළ ඔහුගේ විධාන භූමිකාව හේතුවෙන් සර්ව භෞමික අධිකරණ බලය යටතේ නඩු පවරනු ලැබීමේ අවදානම දරණ ඉහළම රාජ්‍ය නිලධාරියෙකි" යැයි සත්‍යය සහ යුක්තිය සඳහා වන ජාත්‍යන්තර ව්‍යාපෘතියේ විධායක අධ්‍යක්ෂිකා සූකා මහත්මිය ප්‍රකාශ කළාය.

ආ ගිය අතක් නොමැති සහ බලහත්කාරී අතුරුදහන්වීම් පිළිබඳ ලෝකයේ දෙවැනි විශාලතම සංඛ්‍යාව වාර්තා වී යැයි සැළකෙන රටක අතුරුදහන් වූ දස දහස් සංඛ්‍යාතවුන්ගේ ඉරණම පිළිබඳ විමර්ශනය කිරීම භාරව ඇත්තේ අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාංශයට ය.

'මේ සා අපකීර්තියට පත් ව්‍යුහයකට අරමුදල් සම්පාදනය කිරීමෙන් වළකින්නැයි ඉල්ලා අපි එක්සත් ජාතීන්ගේ සාම සාධන අරමුදලට[2] සහ ජාත්‍යන්තර ආධාර දෙන්නන්ට ලියා යැවීමට කටයුතු කරන අතරම ගැටළු සහගත පත්වීම් පිළිබඳ රහස්‍ය ලේඛන ගොණුවක් එක්සත් ජාතීන්ගේ අදාළ ආයතන සහ සාමාජික රාජ්‍යයන් වෙත යවන්නෙමු"යි සූකා මහත්මිය කියා සිටියාය. "ලංකාව තුළත්, ඉන් බැහැරත් සිටින වින්දිත ප්‍රජාවන්ගෙන් අපි ඉල්ලා සිටින්නේ, ශ්‍රී ලංකා රජයේ අතීත අපරාධ වසන් කිරීම සඳහා නිර්මාණය කළ දණ්ඩ මුක්ති උපායකට අරමුදල් සැපයීම සඳහා තමන්ගේ බදු මුදල් භාවිතා නොකරන මෙන් එක්සත් ජාතීන්ගෙන් සහ අනෙකුත් ආධාර දෙන්නන්ගෙන් ඉල්ලා සිටින ලෙසයි."

---

[1] https://twitter.com/ParliamentLK/status/1395391026194354176

[2] A/HRC/46/20 §4. On UN funding.
සහ : https://un-peacebuilding.tumblr.com/post/173297015670/the-pbf-in-sri-lanka

මෙයට කලින්, අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාංශයේ සභාපතිවරයා වශයෙන් විනිසුරු උපාලි අබේරත්න පත්කරනු ලැබීම වනාහී 'ඍජු අවමානයක් සහ ප්‍රචණ්ඩක්‍රියාවකැ'[3]යි ශ්‍රී ලංකාවේ වින්දිත පවුල් විසින් දැනටමත් හඳුන්වා දී තිබේ. අතුරුදහන්වීම් ඇතුළු 'සංකේතාත්මක' මානව හිමිකම් නඩු විභාග කිහිපයකට අදාළ අධිකරණ ක්‍රියාවලියට බාධාකාරීව මැදිහත් වූ බවට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස්වරිය විසින් ප්‍රකාශ කරන ලද, දේශපාලන පළිගැනීම් පිළිබඳ සොයා බැලීම සඳහායැයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් ස්ථාපිත කළ කොමිසමක සභාපතිවරයා වූයේ විනිසුරු අබේරත්න ය. අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාංශයේ ප්‍රධානත්වය සඳහා ඔහු පත්කිරීම එම ව්‍යුහයේ ස්වාධීනත්වය සහ විශ්වසනීයත්වයත්, ඊට ඵලදායී ලෙස ක්‍රියාකිරීමට ඇති හැකියාවත් බරපතල ලෙස බිඳ දැමීමක් යැයි එක්සත් ජාතීන්ගේ සංවිධානය කීය.[4]

අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාංශය වනාහී ශ්‍රී ලංකාවේ ස්ථාපිත කරන ලද සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ ව්‍යුහයන් දෙකෙන් එකකි; වින්දිතයන්ට ආධාර කිරීමේ චේතනාවෙන් පිහිටුවන ලද[5] හානි පූර්ණ කාර්යාලය දෙවැන්නයි.

ජනාධිපතිවරයාගේ මිත්‍ර පාක්ෂිකයකු වන විශ්‍රාමික මේජර් ජෙනරාල් වඩුගේ පාලිත පියසිරි ප්‍රනාන්දු පත්කිරීම මගින් හානි පූර්ණ කාර්යාලය ද දැන් මිලිරිකරණයට පාත්‍ර කර තිබේ. පාවෙන අවි ගබඩා කොන්ත්‍රාක්තුවකින්[6] එක්සත් ජනපද ඩොලර් මිලියන 62ක මුදලක් අයුතු ලෙස අත්පත් කරගැනීම සහ වංචාකිරීමට අදාළව ඔවුන්ගේ භූමිකාව සම්බන්ධයෙන් මේජර් ජෙනරාල් පාලිත ප්‍රනාන්දු සහ ගෝඨාභය රාජපක්ෂට එරෙහිව චෝදනා ගොණු කළ යුතුයැයි[7] පසුගිය ආණ්ඩුව විසින් පත්කරන ලද කොමිසමක් මගින් නිර්දේශ කරනු ලැබුණි. ප්‍රනාන්දු විසින් අනාගතයේදී රජයේ තනතුරු දැරීම වැළැක්විය යුතු බවද එම කොමිසම විසින් වැඩිදුරටත් නිර්දේශ කරන ලදී. කෙසේවුවද, ස්වකීය මිත්‍ර පාක්ෂිකයන්ගෙන්දේශපාලන පළිගැනීම් සිදුකිරීම සම්බන්ධයෙන් විභාග කර බැලීම සඳහා තවත් ජනාධිපති කොමිසමක්, 2019දී ආණ්ඩු වෙනසෙන් පසු,  ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ විසින් ස්ථාපිත කරනු ලැබුණි. මෙම කොමිසමේ සොයාගැනීම්, පසුගිය ආණ්ඩුවේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම විසින් තමාට එරෙහිව සාක්ෂි ගෙතූ බවට ප්‍රනාන්දු විසින් කරන ලද චෝදනාවන්ට[8] වාසිදායක ඒවා විය. මෙකී නව ජනාධිපති කොමිසම විසින් ඔහු නිදොස්කිරීමට කලින්ම, රජයේ අමාත්‍යාංශයක ලේකම්වරයකු වශයෙන්[9] ප්‍රනාන්දුව පත්කරනු ලැබිණ. ඉහත නඩු විභාගයටම අදාළව, ප්‍රනාන්දුට එරෙහිව නගා තිබූ ගිනිඅවි සම්බන්ධ හත් දහසකට වැඩි චෝදනා ද, 2019දී ආණ්ඩු මාරුවෙන් කෙටි කලක් ඇතුළතදී අත්හැර දැමුණි.[10]

"හමුදාව හේතුවෙන් පීඩාවට පත් දෙමළ වින්දිතයන් සඳහා ගෙවිය යුතු විශාල මුදල් සම්භාරයක් සමග සම්බන්ධතාවක් හානි පූර්ණ ක්‍රියාවලියට තිබිය හැකි අතර කලින් ජාත්‍යන්තර ප්‍රජාව විසින් විශ්වාසනීය යැයි පිළිගෙන සහාය දෙන ලද ක්‍රියාදාමයක් යටතේ අධිකරණයක් විසින් පරීක්‍ෂා කොට විධිමත් ලෙස නිශ්ප්‍රභා නොකළ දූෂණ වංචා පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් පුළුල් පොලිස් විමර්ශනයන්ට පාත්‍ර වූ පුද්ගලයකු හානි පූර්ණය සම්බන්ධ ව්‍යුහයට පත්කිරීම මගින් සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන් දැන් මිලිටරීකරණයට භාජනය කර ඇතැ"යි සූකා මහත්මිය ප්‍රකාශ කළාය.

---

[3] https://srilankabrief.org/the-appointment-of-justice-upali-abeyrathne-as-head-of-the-omp-is-a-direct-insult-and-an-act-of-violence-against-families-of-the-disappeared-sandya-ekneligoda/

[4] A/HRC/ 46/20. §44.

[5] https://twitter.com/parliamentlk

[6] https://www.newsfirst.lk/2019/09/23/avant-garde-gotabaya-rajapaksa-and-7-others-aquitted-of-all-charges/
$75 m මෙතැනින් https://www.marsecreview.com/2016/09/charges-in-avant-garde-case/
http://www.dailymirror.lk/front_page/Avant-Garde-case-Gota-seven-others-de-manacled/238-174976
PRECIFAC සිංහල වාර්තාවේ ඉංග්‍රීසි සාරාංශය. https://www.colombotelegraph.com/wp-content/uploads/2018/02/PRECIFAC-34-CASES-1.pdf

[7] https://www.colombotelegraph.com/wp-content/uploads/2018/02/PRECIFAC-34-CASES-1.pdf
Case number 5.

[8] http://www.jdslanka.org/index.php/news-features/politics-a-current-affairs/1013-sri-lanka-gearing-towards-legalizing-impunity-for-gross-human-rights-violations

[9] [ආණ්ඩුවේ වෙබ් අඩවිය: http://www.pmdnews.lk/පහළම-තැන-සිට-වැඩ-අරඹා-තිබේ/]

[10] ගිනිඅවි සහ පුපුරන ද්‍රව්‍ය පනත යටතේ වැරදි: https://www.dailynews.lk/2019/08/22/law-order/194740/record-7573-charges-filed-avant-garde-floating-armoury-case Case No. **TAB/751/2019**.
**නිදහස්කිරීම:** https://www.newsfirst.lk/2020/01/17/5-released-from-the-avant-garde-case/

මේ අතර, හිටපු පොලිස්පති ජයන්ත වික්‍රමරත්නගේ සගයකු වූ චන්ද්‍රා නිමල් වාකිෂ්ඨ අභිනවයෙන් තැනූ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට[11] පත්කර තිබේ. වදහිංසා කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු යැයි එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් කියා සිටි පොලිස් ත්‍රස්ත විමර්ශන ඒකකය 2009-10 වකවානුවේදී ක්‍රියාත්මක වූයේ වාකිෂ්ඨ යටතේ ය.

"මානව හිමිකම් උල්ලංඝණයන් සිදු වූ වකවානුවේදී බලය හිමිව තිබූ ආරක්ෂක නිලධාරීන්ම ඇතුළත් කර ඇති සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයන් සමග සුරක්ෂිතව ගණුදෙනු කිරීමට ශ්‍රී ලංකාවේ අතුරුදහන්වූවන්ගේ පවුල්වලට නොහැකි ය. මෙකී ව්‍යුහයන් පැවතීම විසින්ම සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව පිළිබඳ බරපතල අවදානමක් මතු කරතැ"යි සූකා මහත්මිය කීවාය.

[11] https://ciaboc.gov.lk/media-centre/latest-news/928-assuming-duties-of-the-new-commission

INTERNATIONAL
TRUTH
AND JUSTICE
PROJECT